සැ. යු.– 2007.04.20 වැනි දින අංක 1,494 දරන *ගැසට් පත්‍රයෙහි* IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,495 - 2007 අප්‍රේල් 27 වැනි සිකුරාදා - 2007.04.27

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 368 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 364 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 369 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 366 | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


363 - B 079483—9603 (2007/04)

# බඩු බාහිරාදිය විකිණීම්

## අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය

අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති, රාජසන්තක කරන ලද හිමිකම් නොපෑ නඩු අංක මැකී ඇති, නඩු වාර්තා සොයාගැනීමට අපහසු භාණ්ඩ වල අංක මැකී ඇති පහත සඳහන් භාණ්ඩ 2007.05.20 (ඉරිදා) දින පෙ.ව. 9.30ට අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන අයෙකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින හෝ එදිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණය වෙත සනාථ කළ යුතුය.

03. අධිකරණ කාර්ය මංඩලයේ නිලධාරියෙකුගේ අවසරය ඇතිව වෙන්දේසි දින පෙ. ව. 9.00 සිට වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් තීරණය කරන ලද අවම ලන්සුව නොපිළි ගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව ඇත.

05. වෙන්දේසියෙන් මිළදී ගනු ලබන ද්‍රව්‍යයන් එවේලේම මුදල් ගෙවා ප.ව. 4.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

06. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද ද්‍රව්‍යයන් සඳහා ගැනුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරී අවසන්වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර, පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි.

වසන්ත ජිනදාස,
මහෙස්ත්‍රාත්,
අනුරාධපුර.

2007 මාර්තු මස 21 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 01. | පීආර්32/07 | අපැහැදිලියි | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 02. | එම | අපැහැදිලියි | මවුන්ටන් මාදිලියේ අබලන් පාපැදි 01 |
| 03. | එම | අපැහැදිලියි | කාන්තා මාදිලියේ අබලන් පාපැදි 01 |
| 04. | 44825 | 32887 | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 05. | ඒ440/07 | අපැහැදිලියි | එම |
| 06. | අපැහැදිලියි | අපැහැදිලියි | එම |
| 07. | ඒ03/07 | ඒ283132 | හීරෝ වර්ගයේ අබලන් පාපැදි 01 |
| 08. | ඒ02/07 | 599098 | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 09. | ඒ03/07 | 56079 | ලුමාලා වර්ගයේ අබලන් පාපැදි 01 |
| 10. | ඒ2596/06 | එල්001/11 | එම |
| 11. | ඒ2596/06 | ඒසීඉසෙඩ් 65358 | එම |
| 12. | ඒ1917/06 | 12පී9991 | ස්පෝර්ට් මාදිලියේ අබලන් පාපැදි 01 |
| 13. | ඒ2324/06 | අපැහැදිලියි | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 14. | ඒ2324/06 | එෆ්ඕබී 5306603 | මවුන්ටන් වර්ගයේ අබලන් පාපැදි 01 |
| 15. | 59053 | අපැහැදිලියි | ලුමාලා වර්ගයේ අබලන් පාපැදි 01 |
| 16. | ඒ388/07 | බී182589 | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 17. | බී3255/05 | එම්එස්84635 | එවෝන් වර්ගයේ අබලන් පාපැදි 01 |
| 18. | බී1684/05 | අපැහැදිලියි | සිංගර් වර්ගයේ අබලන් පාපැදි 01 |
| 19. | අපැහැදිලියි | 1බීපී8790 | රැලේ වර්ගයේ අබලන් පාපැදි 01 |
| 20. | 73783 | 55779991 | ලුමාලා වර්ගයේ අබලන් පාපැදි 01 |
| 21. | අපැහැදිලියි | අපැහැදිලියි | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 22. | අපැහැදිලියි | අපැහැදිලියි | කාන්තා මාදිලියේ අබලන් පාපැදි 01 |
| 23. | අපැහැදිලියි | අපැහැදිලියි | ලුමාලා වර්ගයේ අබලන් පාපැදි 01 |
| 24. | අපැහැදිලියි | අපැහැදිලියි | දැවී ගිය අබලන් පාපැදි 01 |
| 25. | අපැහැදිලියි | 53593545 | ලුමාලා වර්ගයේ අබලන් පාපැදි01 |
| 26. | අපැහැදිලියි | වී112042 | හීරෝ වර්ගයේ අබලන් පාපැදි 01 |
| 27. | ඒ558/05 | 37138822 | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 28. | අපැහැදිලියි | බී139020 | සිගර් වර්ගයේ අබලන් පාපැදි 01 |
| 29. | අපැහැදිලියි | 8එෆ්00975 | හැමිල්ටන් වර්ගයේ අබලන් පාපැදි 01 |
| 30. | අපැහැදිලියි | ආර්418714 | හීරෝ වර්ගයේ අබලන් පාපැදි 01 |
| 31. | අපැහැදිලියි | අපැහැදිලියි | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 32. | බී 363/05 | 2553494 | ලුමාලා වර්ගයේ අබලන් පාපැදි 01 |
| 33. | අපැහැදිලියි | අපැහැදිලියි | ඒසියා බයික් වර්ගයේ අබලන් පාපැදි 01 |
| 34. | බී3125/05 | එස්ටී 8530 | වර්ගය අපැහැදිලි අබලන් පාපැදි 01 |
| 35. | බී275/06 | ඒ1661336 | හීරෝ වර්ගයේ අබලන් පාපැදි 01 |
| 36. | ඒ242/07 | අපැහැදිලියි | කැති 02, වප් පිහි 01 |
| 37. | 43862/43861 | - | කැති 02 |
| 38. | 43859/43459 | - | කැති 02 |
| 39. | 43857/43855 | - | කැති 02 |
| 40. | 43850/43855 | - | කැති 02 |
| 41. | 43864/43865 | - | කැති 02 |
| 42. | 43843/29306 | - | කැති 02 |
| 43. | 49192 | - | මිටි 01, අලවංගු 01 |
| 44. | 49195 | - | මිටි 01, යකඩ කටු 01 |
| 45. | 48996/34081 39376 | - | අත් කියත් 01, නියන් 01, අතකොළු 02, යතුකැට 01 |
| 46. | 12175/12174 | - | පොරෝ 02 |
| 47. | 38657/7616 | - | පොරෝ 02 |
| 48. | 50930/50932 | - | අත් කියත් 02, අතකොළු 01, නියන් 01 යතු කැට 01 |
| 49. | 50932/50928 47649 | - | පොරෝ 01, අතකොළු 01, නියන් 01, යතු කැට 01 |
| 50. | 37088/37089 37090 | - | මල්ටි ප්ලග් 01, වයර් රෝල් කීපයක් |
| 51. | බී1203/06 | - | ලන්තෑරුම් 01, පොඩි මුට්ටි 01, ගිරා 01, පොඩි පිත්තල පහන් 01, මේස පිහි 01, කැති 01, වයර් රෝල් 02 |
| 52. | 49347 | - | ඇලුමිනියම් මුට්ටි 02, පොඩි තාච්චි 01 |
| 53. | 57054 | - | ප්ලාස්ටික් කළ 02 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 54. | 60808 | - | සවල් 02 |
| 55. | 56375 | - | උදළු 02, සවල් 02 |
| 56. | බී 1064/06 | - | යාන්ත්‍රික දම්වැල් කියත් 01, අඩිකෝදු 01, මිනුම්පටි 01 |
| 57. | 56146 | - | යාන්ත්‍රික දම්වැල් කියත් 01 |
| 58. | 53478 | - | එම |
| 59. | බී1305/06 | - | එම |
| 60. | අපැහැදිලියි | අපැහැදිලියි | යමහා ඩී. ටී. වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 61. | අපැහැදිලියි | 500-0755 | සුපර්කබ් මාදිලියේ අබලන් යතුරු පැදි 01 |
| 62. | අපැහැදිලියි | 97-8021 | හොන්ඩා වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 63. | අපැහැදිලියි | අපැහැදිලියි | වැපි වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 64. | ඒ554/05 | 112-7088 | වැලි වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 65. | අපැහැදිලියි | 100-7828 | හොන්ඩා තැපැල් 90 වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 66. | අපැහැදිලියි | අපැහැදිලියි | එම |
| 67. | අපැහැදිලියි | අපැහැදිලියි | මේට් 50 මාදිලියේ අබලන් යතුරු පැදි 01 |
| 68. | අපැහැදිලියි | අපැහැදිලියි | එම |
| 69. | 96819 | 143-7721 | හොන්ඩා සුපර්කබ් වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 70. | 55017 | වැසි අංක එල් ඉසෙඩ් එස්පීසී එෆ් එල් ඒ 1350000 | කින්පින් වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 71. | ඒ1535/06 | 102-0699 | හොන්ඩා සීඩී 125 වර්ගයේ අබලන් යතුරු පැදි 01 |
| 72. | - | - | හිස් බෝතල් තොගයක් |
| 73. | - | - | හිස් බූලි කීපයක් |
| 74. | - | - | හිස් බැරල් කිපයක් |
| 75. | - | 41 ශ්‍රී 1532 | දිරාපත් වී ඇති අබලන් ලොරි රථය |

04-410

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - ඇල්පිටිය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ හිමිකම් නොකියන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

ඇල්පිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකරුවන් හිමිකම් නොකියන ලද නඩු අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් නඩු භාණ්ඩ 2007, මැයි මස 20 වන ඉරුදින පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය. භාණ්ඩ පරීක්ෂා කිරීම වෙන්දේසි දින පෙ.ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා සිදු කළ හැකිය.

අධිකරණය මගින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එකී වේලාවේදීම, මුදල් ගෙවා ඒවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී ගැනුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛනයක් ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසිය පිළිබඳ සියලුම අවසන් තීරණ ගැනීමේ බලය මහෙස්ත්‍රාත්වරයා සතුවේ.

ඩබ්ලිව්. එම්. එම්. තල්ගොඩපිටිය,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
ඇල්පිටිය.

2007 මාර්තු මස 30 වැනි දින,
ඇල්පිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ ලැයිස්තුව

| | | |
|---|---|---|
| 1. | 11879 | කියත් එකයි. |
| 2. | 99768 | කියත් එකයි. |
| 3. | 89955 | රවුම් කියත් තල එකයි. |
| 4. | අංක රහිත | රවුම් කියත් තල එකයි. |
| 5. | අංක රහිත | කියත් එකයි. |
| 6. | 86350 | බන්ඩි කියත් එකයි. |
| 7. | 7269 | කියත් එකයි. |
| 8. | ඒ.ආර්.115/07 | වඩු බංකුව සමහ ඉරුම් කියත් එකයි. |
| 9. | 26520 | වඩු බංකුව සමහ ඉරුම් කියත් එකයි. |
| 10. | 22596 | වඩු බංකුව සමහ ඉරුම් කියත් එකයි. |
| 11. | අංක රහිත | වීදුරු බෝතල තොගයක් |
| 12. | අංක රහිත | තඹ දහර තොගයක් |
| 13. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් කෑන් තොගයක් |
| 14. | 41596 | බැටරි ඔරලෝසු තරාදි 01 යි. |
| 15. | 41600 | එල්ලන තරාදි එකයි. |
| 16. | 41598 | එල්ලන තරාදි එකයි. |
| 17. | 41597 | එල්ලන තරාදි එකයි. |
| 18. | 24483 | වී.සී.ඩී. යන්ත්‍රය |
| 19. | ඒ.ආර්. 27/05 | අඟල් 21 වර්ණ රූපවාහිනී යන්ත්‍රය (අබලන්) සහ අඟල් 14 වර්ණ රූපවාහිනී යන්ත්‍රයක් (අබලන්) |
| 20. | අංක රහිත | හෙල්මට් 05 |
| 21. | 1818 | සුදුපාට හෙල්මට් එකයි. |
| 22. | අංක රහිත | විල්බැරෝ හයයි. |
| 23. | අංක රහිත | ජැක්පොට් යන්ත්‍ර 2යි. |
| 24. | 1406 | ජැක් එකයි. |
| 25. | අංක රහිත | ගෑස් ලිපක කොටසක් |
| 26. | අංක රහිත | වේවැල් කුඩ 05යි. |
| 27. | අංක රහිත | වැලි ගොඩදමන ලොකු බාල්දි දෙකයි. |
| 28. | අංක රහිත | තාච්චි 04 යි. |
| 29. | 43399 | සවල් එකයි. |
| 30. | 32097 | සවල් එකයි. |
| 31. | 24459 | සවල් එකයි. |

| | | |
|---|---|---|
| 32. | 18326 | සවල් එකයි. |
| 33. | 41416 | සවල් එකයි. |
| 34. | 41926 | සවල් එකයි. |
| 35. | 44525 | සවලක් හා උදැල්ලක් |
| 36. | 44755 | සවල් එකයි. |
| 37. | අංක රහිත | සවල් 34 යි. |
| 38. | 42346 | උදැල්ලක්. |
| 39. | 36342 | බාල්දි එකයි. |
| 40. | 36338 | බාල්දි එකයි. |
| 41. | 36481 | බාල්දි එකයි. |
| 42. | 36344 | බාල්දි එකයි. |
| 43. | අංක රහිත | බාල්දි 9 යි. |
| 44. | ඒ.ආර්.727/06 | පාපැදි එකයි. |
| 45. | ඒ.ආර්.1301/06 | පාපැදි එකයි. |
| 46. | ඒ.ආර්.1302/06 | පාපැදි එකයි. |
| 47. | ඒ.ආර්.1303/06 | පාපැදි එකයි. |
| 48. | ඒ.ආර්.1304/06 | පාපැදි එකයි. |
| 49. | ඒ.ආර්.1305/06 | පාපැදි එකයි. |
| 50. | ඒ.ආර්. 1300/06 | පාපැදි එකයි |
| 51. | ඒ.ආර්.807/05 | පාපැදි එකයි. |
| 52. | ඒ.ආර්.714/05 | පාපැදි එකයි. |
| 53. | ඒ.ආර්.264/05 | පාපැදි එකයි. |
| 54. | ඒ.ආර්.202 | පාපැදි එකයි. |
| 55. | ඒ.ආර්.325/05 | පාපැදි එකයි. |
| 56. | ඒ.ආර්.808/05 | පාපැදි එකයි. |
| 57. | ඒ.ආර්.1452 | පාපැදි එකයි. |
| 58. | අංක රහිත | පාපැදි එකයි. |
| 59. | අංක රහිත | පාපැදි එකයි. |
| 60. | අංක රහිත | පාපැදි එකයි. |
| 61. | අංක රහිත | පාපැදි එකයි. |
| 62. | අංක රහිත | පාපැදි එකයි. |
| 63. | ඒ.ආර්. 29/05 | ලියාපදිංචි අංක රහිත බජාජ් බොක්සර් වර්ගයේ යතුරු පැදිය |
| 64. | ඒ.ආර්.800/05 | ලියාපදිංචි අංක රහිත හොණ්ඩා වැලි යතුරු පැදිය |
| 65. | ඒ.ආර්.259/05 | 149/0993 යමහා මේට් යතුරු පැදිය |
| 66. | ඒ.ආර්.1215/06 | 123/7291 හොණ්ඩා ට්‍රේල් යතුරු පැදිය |
| 67. | ඒ.ආර්. 1145 | 106/7861 හොණ්ඩා ට්‍රේල් යතුරු පැදිය |
| 68. | ඒ.ආර්.1145 | 139/2938 ආර්. ජී. 50 හොණ්ඩා යතුරු පැදිය |
| 69. | ඒ. ආර්. 1105/06 | 92 ශ්‍රී 1485 හොණ්ඩා එම්. ඩී. 90 යතුරු පැදිය |
| 70. | ඒ.ආර්. 1214/06 | 114/2682 හොණ්ඩා වැලි යතුරු පැදිය |
| 71. | ඒ.ආර්.1018 | 143/8841 කවසාකි ට්‍රේල් යතුරු පැදිය |
| 72. | ඒ.ආර්. 529 | 139/0433 යමහා මේට් යතුරු පැදිය |
| 73. | 33009 | 154/8416 එම්. ඩී. 90 හොණ්ඩා යතුරු පැදිය (අබලන්) |
| 74. | අංක රහිත | 102/8019 එම්. ඩී. 05 හොණ්ඩා යතුරු පැදිය |
| 75. | අංක රහිත | 96 ශ්‍රී 0115 හොණ්ඩා යතුරු පැදිය |
| 76. | අංක රහිත | 128/1980 හොණ්ඩා වැලි යතුරු පැදිය |
| 77. | 36880 | 15 ශ්‍රී 2264 ත්‍රීවීලර් රථය |

04-411

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## 2007/2008 වර්ෂය සඳහා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

2007.07.01 සිට 2008.06.30 දක්වා

2007 ජූලි මස 01 දින සිට 2008 ජූනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක් ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණය යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද, ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක 13 දරන පම්බල රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2007 මැයි මස 18 වැනි දින පෙ. ව. 10.00 ට පෙර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.05.20 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2007 මැයි මස 18 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර් කරුවන් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2007.06.04 වැනි දින පෙ. ව. 10.00ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතුය.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

වික්‍රම වරාගොඩ,
ප්‍රාදේශීය ලේකම්,
මාදම්පේ.

උපලේඛනය

| *කොට්ඨාශය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| උතුරු පිටිගල් | පම්බල | 13 | 2007.05.18 පෙ. ව. 10.00 | 1,000 |

04 - 504

---

**2007 ජූලි මස 01 වැනි දින සිට 2008 ජුනි මස 30 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

2007 ජූලි මස 01 වැනි දින සිට 2008 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක් ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද, ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ............................දරන ..................................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2007.05.16 වැනි දින පෙ. ව. 10.00 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.05.20 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2007 මැයි මස 16 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඳර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර් කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2007.05.30 වැනි දින පෙ. ව. 10.00ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

එස්. එම්. එල්. චන්ද්‍රසිරි,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

මගේ අංකය :- නා/ආ/5/10/03,
2007 අප්‍රේල් මස 10 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
නාත්තන්ඩිය.

උපලේඛනය

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ගම | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 01 | නාත්තන්ඩිය | මූදුකටුව | 2007.05.16 වැනි දින පෙ. ව. 10.00 | 1,000 |
| 02. | එම | කටුනේරිය | එම | 1,000 |

04-499

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පානදුර 6 වන හරස්පාරේ අංක 26/1 ස්ථානයේ කරුණාකලගේ අරුණ පාලිත ද සිල්වා වන මා විසින් වර්ෂ 1988.10.17 වැනි දින පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ලියනආරච්චිගේ මලික් ප්‍රසන්න විජේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 2126 දරන ඇටර්නි බලකරය මත පානදුර, නල්ලුරුව "පවිත්‍ර " හි පදිංචි කරුණා කලගේ ලාල් සනත් ද සිල්වා වෙත පවරන ලද ඇටර්නි බලය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවට දැනුම් දෙමි. ඒ අනුව වර්ෂ 2007ක් වූ අප්‍රේල් මස 12 දින සිට කරුණාකලගේ ලාල් සනත් ද සිල්වා විසින් සිදු කරනු ලබන ක්‍රියාවලින් මා බැඳී නොසිටින බවත් ඒ සඳහා වග නොකියන බවත් සියලු දෙනාම මෙයින් දැනගත යුතුය.

කරුණාකලගේ අරුණ පාලිත ද සිල්වා.

04-419

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙහිවල කඩවත පාරේ අංක 69/4 හි පදිංචි ඇන්තනි එල්ඩ්රිච් ෂොක්මන් වන මම පද්මිනි එච්. වෙහැල්ල ප්‍ර. නො. තැනගේ අංක 2518 සහ වර්ෂ 2003.01.10 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ඇති අතර, බී. ඒ. ඊ. සුවාරිස්ගේ කටයුතු වලට මින්පසු වග නොකියමි.

ඒ. ඊ. ෂොක්මන්.

2007 අප්‍රේල් මස 07 වැනි දින.

04-486

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කඩුවෙල, වෙලිවිට, අංක 339 දරන ස්ථානයේ පදිංචි, පට්ටිවිදානලාගේ ඩේවිඩ් පෙරේරා වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. ආර්. ප්‍රියදර්ශනී මහත්මිය විසින් වර්ෂ 2004 ක් වූ නොවැම්බර් මස 19 වැනි දින ලියා සහතික කළ අංක 1639 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අංගොඩ, කැළණිමුල්ල, හංසගම, අංක 238/ඒ/17 දරන ස්ථානයේ පදිංචි, මාරප්පුලිගේ මාලනී සමරනායක සිරිල් ධර්මරත්න යන අය වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

එකී ඇටෝර්නි බලකරු විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වග කියනු නොලැබේ.

පට්ටිවිදානලාගේ ඩේවිඩ් පෙරේරා.

2007ක් වූ ජනවාරි මස 20 වැනි දින.

04-492

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – ගාල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. මරික්කාර් විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ 1998.11.09 දින සහ අංක 7688 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙනරත් ආනන්ද විමලසේන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ හබරාදූව ප්‍රාදේශීය සභා සීමාව තුළ දළුවැල්ලේ පිහිටි පදිලිගේ වත්ත හෙවත් මහා විදානෙලාගේ වත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 සහ ලොට් 2 දරන ඉඩම් කැබලි දෙක සහ ඊට අයත් ගොඩනැගිලි ආදී සියලු දේත් සමග වේ.

විශාලත්වය ලොට් 1 රූ. 2 පර්චස් 5.6, ලොට් 2 පර්චස් 10.2

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී 2007 මැයි මස 18 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.03.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2007.03.20 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

01. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%)ක් ද,
04. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
05. සියළුම ප්‍රචාරක වියදම්,
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහ (රු. 2,000)ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, ගාල්ල ශාඛාව (දුරකථන අංක 091-2232248) හෝ කොළඹ 10 ටී. බී. ජයා මාවත අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු,

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාලය සංකීර්ණය,
කොළඹ 12

04-455

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – නොච්චියාගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. සෙනරත් විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2002.11.08 දින අංක 3138 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, විදානරාලලාගේ ඉස්කෝල්වත්ත ගෙදර රොහාන් රණතුංග, සුමිත්‍රා අන්දිරික්කු ජයරත්න සහ විදානරාලලාගේ ලයනල් ගුණතිලක ණයකරුවන් සහ විදානරාලලාගේ ඉස්කෝල්වත්තේ ගෙදර රොහාන් රණතුංග උකස්කරු හැටියට පැහැරහැර ඇති හෙයින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල යටතේ අයවිය යුතු ණය මුදල් ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කරන ලද දේපල වර්ෂ 2007ක් වූ මැයි මස 15 වැනි දින පෙ. ව. 10.30 ට දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ ගරාඩුව පිහිටි මහතිත්තවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල විසින් සාදන ලද 2002.01.20 දින අංක 1622 පිඹුරේ ලොට් 1 ලෙස නිරූපිත ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලුම දේත් සමග වේ. (පේරගස්වත්ත කඩය අසල ඇති "සුමිත්‍රා සෙවණ" නිවස සහ කඩකාමර ද වේ.)

ඉඩමේ විශාලත්වය රූඩ් එකයි (01)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.03.10 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2006.03.22 දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු වේ. ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා අයබදු සඳහා 1% (සියයට එකක්), වෙන්දේසිකරුගේ කොමිස් මුදල් 2 1/2% (සියයට දෙකහමාරක්), විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 2000, ලිපිකරු හා සෝෂක වේතන රු. 500 සහ සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත, කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ ආපසු අයකර ගැනීම්) වෙත ගෙවිය යුතුය. දුරකථන අංක 2661815, 2661819 දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු එම ලිපිනයේ නීති නිලධාරී වෙතින් ලබාගත හැකිය.

එන්. එච්. පී. ආරියරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු,

මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම පාර, අංක 14
දුරකථන අංක : 041-2223847/2231263.

04-456

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### අක්කර 40 ක් විශාල අගනා ඉඩමක් පුත්තලම දිස්ත්‍රික්කයෙන්

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, අක්කරෙයි පත්තුවේ තොටපොළ ග්‍රාමයේ පිහිටි මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් මැන සාදන ලද අංක **C** 54 හා වර්ෂ 1972 ක්වූ ජනවාරි මස 30 දින දරන සැලැස්මේ පෙන්වා ඇති මල්ලිකා ගෘප් හි ලොට් 1 දරන බිම් කැබැල්ලේහි පිහිටි වතු වගාවන් හා ස්ථානය බලයලත් මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් සාදන ලද අංක **C** 15 හා 1968 අගෝස්තු මස 26 දින දරන සැලැස්මේ ලොට් 22 හි අතුරු බෙදීමක් වන එකී ලොට් 1 ට මායිම් උතුරට ලොට් 54 හි ලොට් 2, නැගෙනහිරට පාර ද, දකුණට මල්ලිකා ගෘප් වතුයායේ කොටසක් සහ බස්නාහිරට පාරද යන මෙකී මායිම් තුල පිහිටි අක්කර හතලිහ (40 අ. 0 රූ. 0 පර්චස්) විශාලවූ එහි අංක 54 දරන සැලැස්ම ප්‍රකාරවය. පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ **Q**10/215 හි දරන හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තාවූද ඉඩම වේ.

රුපියල් තිස්අට ලක්ෂ තිස් අටදහස් හාරසිය හැට එකයි ශත හතලිස් අට (රු. 3,038,461.48) ක් මුදලක් 2004 පෙබරවාරි මස 13 වන දින පටන් සම්පූර්ණයෙන් ගෙවන තෙක් වර්ෂයකට 23% බැගින් සහ එකී පොලිය මත පිරිවැටුම් බදු, නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම සඳහා ඉහත සඳහන් දේපල රත්මලාන සිරිමල් උයනේ අශෝක මාවතේ, අංක 07 දරන ස්ථානයේ පදිංචි ඇන්ඩ්‍රෙ විල්හෙල්ම් බල්තසාර් යන අයට විරුද්ධව කොළඹ 02, නවම් මාවතේ අංක 46/38 දරන ස්ථානයේ පිහිටා ඇති ෆෝර්බ්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් ගල්කිස්ස දිසා අධිකරණයේ නඩු අංක 110/04 එම් බී දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම් මත පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2007 ක්වූ මැයි මස 25 වන දින පෙරවරු 11.00 ට අදාල දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය:* පුත්තලම කොළඹ ප්‍රධාන මාර්ගයේ සැතපුම් 78 1/2 ක් පමණ ගොස් පලාවි මංසන්දියෙන් වමට හැරී කල්පිටිය මාර්ගයේ තවත් සැතපුම් 3 පමණ සෙතපොල මංසන්දිය දක්වා ගොස් නැවතත් වමට හැරී තොටපොළ පාරේ සැතපුමක් පමණ ගොස් දකුණට හැරී වැලි පාරේ තවත් සැතපුම් දෙකක් පමණ ගිය පසුව මෙම දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. 1. ගැණුම් මිලෙන් 25% ක් ද, 2. පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද 3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, 4. වෙන්දේසි සඳහා දරන්නට වූ වියදම් ද, 5. වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ ගාස්තු වශයෙන් රු. 2000, 6. ලිපිකරු හා ගෝෂක ගාස්තු වශයෙන් රු. 1000/- ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගල්කිස්ස දිසා අධිකරණයේ අංක 110/04/එම්බී දරන මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩිදුර විස්තර සහ අදාල ලියවිලි පරීක්ෂා කිරීම සඳහා කොළඹ 03, කර්නල් ටී. ජී. ජයවර්ධන මාවතේ (පාර්ම් ග්‍රෝව්) අංක 26/1 දරන ස්ථානයේ පිහිටි නීතිඥවරුන් වන ප්‍රසන්න එස් ගුණවර්ධන මහතාගෙන් විමසන්න. දුරකථන අංක 5367788, 2372162, 2372163, 2372164, 2372165 හෝ 071-266102

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු

134, බැද්දගාන පාර, කෝට්ටේ
දුරකථන අංක : 2873656, ෆැක්ස් අංකය : 2871184
ජංගම : 0777-672082.

04-467

---

## මහජන බැංකුව - කොබෙයිගනේ ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, බලදොර කෝරළේ, කොබෙයිගනේ ගමෙහි පිහිටි "වානෝහේන" (දැනට වත්ත) නැමති ඉඩමට සාදන ලද අංක 5509 සහ 2002.09.22 දිනැති පිඹුරේ ලොට් 01 දරන විශාලත්වය පර්චස් තුනයි දශම නවය (අක්කර 0, රූඩ් 0, පර්. 3.9)ක් විශාල වූ ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදි සැම සියලු දේ ද සමග මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.06.06 දින පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2005.04.15 දින දී ද, දිනමිණ පුවත්පතේ 2005.07.14 දින දී ද, ඩේලි නිවුස් පුවත්පතේ 2005.07.14 දින දී ද, පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම* - කොබෙයිගනේ බස් නැවතුම්පල ඉදිරිපිට දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මහජන බැංකුව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 037-2222453 ෆැක්ස් : 037-2222338

හිමිකම් හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල (සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.
දුරකථන අංක : 037-2220062

04 - 481

## මහජන බැංකුව- දෙල්තොට ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට හේවාවිස්ස කෝරළේ, නවනැලියේ පිහිටි බලයලත් මිනින්දෝරු සෙනරත් විජේරත්න මහතා විසින් 1992.11.24 වන දින මැන සාදන ලද අංක 1682 දරන පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සලකුණු කොට ඇති අක්කර එකයි පර්චස් පහලොවක් (අක්කර 01, රූඩ් 00, පර්චස් 15.0) ක් විශාල කරඳගොල්ලහේන නැමති ඉඩම මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත අප විසින් 2007.06.13 වන දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2004.12.24 වන දින ද, දිනමිණ/තිනකරන් යන පුවත්පත් වල 2007.03.01 වන දිනද, ඩේලි නිවුස් පුවත්පතේ 2007.03.02 වන දින ද පලකර ඇති දේපල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– දෙල්තොට නගරයේ සිට වම්පසට ඇති කොළඹිස්ස පාරේ කි. මීටර් 10 ක් පමණ නවනැලිය දක්වා ගමන් කර දකුණු පසට ඇති අඩිපාරේ මීටර් 90 ක් පමණ පහලට ගමන් කල පසු අඩි පාරේ දකුණු පස ඉහත දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
   ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මහජන බැංකුව මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 081-2234283 ෆැක්ස් : 081-2223017

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ශොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලයලත් වෙන්දේසිකරුවෝ
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන්
වෙනුවෙන් සහ උසාවි කොමසාරිස්වරු)

| | |
|---|---|
| *ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය* | *නව නාගරික කාර්යාලය සහ වෙන්දේසි ශාලාව* |
| අංක 24,ටොරින්ටන් පාර, | අංක 290, හැව්ලොක් පාර, |
| මහනුවර. | කොළඹ 05. |
| දුරකථන අංක | 011-2585408/011-2502680 |
| 081-2224371/081-2227593 | 011-2588176 |
| ෆැක්ස් 081-2224371 | ඊමේල් : samera @srilankanet |

04 - 483

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කිරිදිවැල, රදාවාන පාර, වරිපනම් අංක 5 හි ව්‍යාපාරික කටයුතු වලට සුදුසු පරිසරයක පිහිටි ව්‍යාපාරික ගොඩනැගිල්ලක් සහිත යාව පිහිටි කොටස්

2න් යුක්ත වූ පර්චස් තුනයි දශම හතරයි හයක (අ. 0, රූ. 0, පර්. 3.46) ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.18 වන දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2001.09.28 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් වල 2003.10.02 දින ද පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– කිරිදිවැල හන්දියෙහි, කිරිදිවැල, රදාවාන පාරට, මුහුණ ලා වරිපනම් අංක 5 දරන ස්ථානයේ මෙම ගොඩනැගිල්ල සහිත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප 111, කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 033-2222325, 033-2225008
ෆැක්ස් අංකය : 033-2226165

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
සහ මුළු දිවයිනටම සාමදාන විනිසුරු.

අංක 11/5, කුඩාබුත්ගමුව,
අංගොඩ,
දුරකථනය : 2419126

04-414

---

## මහජන බැංකුව - කඳාන ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රාගම, පැරඩයිස් පෙදෙසෙ හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි නිවසක් සහිත පර්චස් දහඅටක (අ. 0 රූ. 0 පර්. 18.00) ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.11 වැනි දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2006.10.05 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2006.11.29 දින ද පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– රාගම - මහබාගයේ මාර්ගයේ, රාගම නගරයේ පල්ලිය ඉදිරිපිටින් ඇති පැරඩයිස් පෙදෙසට යන පාරේ, මී. 150 ක් පමණ ගමන් කළ විට වෙල්යාය හමුවේ. මෙම වෙල්යාය පසු කර මද දුරක් යාමේ දී පාරේ දකුණුපස එම පාරට මුහුණලා ජා ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, වරිපනම් අංක 28 ඒ දරන අදාල දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප 111, කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325,
ෆැක්ස් අංකය : 033-2226165

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
මුළු දිවයිනටම සාමදාන විනිසුරු.

අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ,
දුරකථනය : 2419126

04-413

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් – කිරිබත්ගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, බලයලත් මානක කේ. මාසිලාමනි විසින් 1993 අගෝස්තු මස 01 වන දින සාදන ලද අංක 1604 දරන පිඹුර පරිදි පෙන්වා දී ඇති ලොට් 01 (බලයලත් මානක එස්. ලෝකනාතන් විසින් 1974 දෙසැම්බර් මස 03 වන දින සාදන ලද අංක 1767

පිඹුරේ පෙන්වා ඇති ලොට් සී2ඒ සහ සී 2බී ඒකාබද්ධ කිරීමකි) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ බියගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ සියනෑ කෝරලේ අධිකාරි පත්තුවේ මාකොළ උතුරේ පිහිටි කෝන්ගහවත්ත, පෙලෙන්ගහවත්ත සහ මිල්ලගහවත්ත ඉඩමේ ඇති ගස්, වැව්ලි හා වෙනත් සියළුම දේ ඇතුළුව පර්චස් 10 ක (අ.0 රූ.0 පර්. 10) විශාල ඉඩම.

"මෙට්‍රෝ එන්ටර්ප්‍රයිස්" යන නාමය විලාශය යටතේ තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන මොහොමඩ් නායිම් මොහොමඩ් රෙෆායි ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2007 ක් වූ මැයි මස 22 වන දින පෙ.ව. 11.00 ට ඉහත ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.10.13 දින රජයේ *ගැසට් පත්‍රයේද*, ලංකාදීප ද, අයිලන්ඩ් සහ තිනකරන් පත්‍ර ද විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.04.27 දින රජයේ *ගැසට් පත්‍රය ද*, 2007.04.27 දින ලංකාදීප සහ ද අයිලන්ඩ් පත්‍ර ද බලන්න.

*ඉඩමට පිවිසීම.*– කොළඹ සිට නුවර පාර ඔස්සේ කිරිබත්ගොඩ හන්දියට ගමන්කර දකුණට හැරෙන්න. මාකොළ පාර ඔස්සේ කිලෝමීටර් 1.600 ක් ගොස් වමට හැරෙන්න. ෆාතිමා ගාඩන් ඔස්සේ මීටර් 250 ක් තවත් ඉදිරියට ගියවිට වම්පැත්ත දෙසට විෂයය වූ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (01%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2000,
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. කළමණාකාරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, අංක 145, නුවර පාර, කිරිබත්ගොඩ,

දුරකථන අංක : 2909956 -7
2909954
ෆැක්ස් අංකය : 2909955

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය, බලයලත්
ජොෂ්ඨ වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393

04-468